මගේ අංකය
எனது இல.
My Number 02/BIS-2023

ඔබේ අංකය
உமது இல.
Your Number

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
Department of Census and Statistics

දිනය
திகதி
Date 24.04.2023

ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියණි,

**ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායයන් කෙරෙහි ආර්ථික අර්බුදයේ බලපෑම තක්සේරු කිරීමේ සමීක්ෂණය - 2023**

කොවිඩ් 19 වසංගතයේ බලපෑමෙන් පීඩනයට ලක්වූ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම පරිමාණයේ ආයතන වර්තමාන ආර්ථික අර්බුදය හේතුවෙන් වඩාත් අවදානමට ලක්ව ඇත. මේ වනවිට බොහෝ ආයතන ප්‍රාග්ධනය, බලශක්තිය මෙන්ම සේවකයන් පිලිබඳ ද ගැටළු වලට මුහුණ දී සිටී. මෙම ආයතනවලට ඇතිවූ බලපෑම අවම කිරීම සඳහා ගතයුතු ඉදිරි පියවර සැලසුම් කිරීම පිණිස කුඩා සහ මධ්‍යම පරිමාණයෙහි ආයතන පිලිබඳ තොරතුරු රජය වෙත අවශ්‍ය වේ. ඒ අනුව ආර්ථික අර්බුදයෙහි බලපෑම තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීමෙහි වගකීම ශ්‍රී ලංකාව සඳහා නිල සංඛ්‍යාති සපයනු ලබන ප්‍රධාන රාජ්‍ය ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී.

2. අප දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා සමීක්ෂණයක් සැලසුම් කරන ලද අතර ඒ සඳහා ඔබ ආයතනය ද තෝරාගනු ලැබ ඇත. ඒ අනුව සමීක්ෂණ කටයුතු සඳහා 2023.04.21 සිට 2023.05.20 දක්වා කාලය තුල ඔබ ආයතනය වෙත පැමිණෙන අපගේ නිලධාරීන්ට තොරතුරු ලබාදීමෙන් සහයෝගය ලබාදෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

3. සංඛ්‍යාලේඛන ආඥාපනත යටතේ එක් රැස් කරනු ලබන මෙම තොරතුරු ආයතන මට්ටමින් කිසිවිටෙක නිකුත් නොකරන අතර ඒවායේ රහස්‍යභාවය දෙපාර්තමේන්තුව මඟින් ආරක්ෂා කරන බවද අවධාරණය කරමි.

4. සමීක්ෂණය පිළිබඳව වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් කරුණාකර දුරකථන අංක 011-2147401 මඟින් කර්මාන්ත, ඉදිකිරීම්,වෙළඳ හා සේවා අංශයේ අධ්‍යක්ෂ අමතන්න.

5. මෙම ජාතික කර්තව්‍ය සඳහා අවශ්‍ය දත්ත සැපයීමෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

ස්තූතියි.

විශ්වාසී,

පී.එම්.පී. අනුර කුමාර

අධ්‍යක්ෂ ජනරාල්

306/71, Polduwa Rd, Battaramulla / PO Box 121 Battaramulla +94-11-214-7000 / +94-11-214-7400 +94-11-214-7011 www.statistics.gov.lk